# අමා ගඟුල

කලාප අංක : 75

ශ්‍රී.බු. ව. 2557 ක් වූ උඳුවප් මස කලාපය, ව. 2013 ක් වූ දෙසැම්බර් මස 16 වන දින



මාතර, ශ්‍රී සුදර්ශි විද්‍යායතන පරිවෙනාධිපති දෙවිනුවර, කපුගම ශ්‍රී සුධර්මාරාමාධිපති

ශාස්ත්‍රපති පූජ්‍යපාද කපුගම සුගතසාර ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.


නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස !!!

## හිතා මතා තිදොරින් කටයුතු කොට සහනය උදාකර ගනිමු.

(මජ්ඣිම නිකායේ අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය ඇසුරෙනි

ගරු ස්වාමීන් වහන්ස, පින්වතුනි,

**"එව මෙව බො රාහුල පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා කායෙන කම්මං කාතබ්බං, පච්ච වෙක්ඛිත්වා පච්ච වෙක්ඛිත්වා වාචාය කම්මං කාතබ්බං, පච්ච වෙක්ඛිත්වා පච්ච වෙක්ඛිත්වා මනසා කම්මං කාතබ්බං"**

"ඒ නිසා රාහුලයෙනි හොඳින් පරීක්ෂා කොට කයින් කර්ම කරන්න. හොඳින් පරීක්ෂා කොට වචනයෙන් කර්ම කරන්න. හොඳින් පරීක්ෂා කොට මනසින් කර්ම කරන්න."

අද උඳුවප් පුර පසළොස්වක පොහොය දිනයයි. 2013 වර්ෂයේ අන්තිම පොහොය දිනයයි. සංඝමිත්තා තෙරණිය ශ්‍රී මහා බෝධියේ දක්ෂිණ ශාඛාව රැගෙන ලක්දිවට වැඩම කළේ අද වැනි උඳුවප් පුර පසළොස්වක පොහොය දිනයකයි. අනුලා දේවිය ප්‍රධාන කාන්තාවන් 500 දෙනෙක් පැවිදි කරවා ලක්දිව මෙහෙණි සස්න ආරම්භ වූයේද අද වැනි පොහොය දිනයකයි. ශ්‍රී මහා බෝධිය මහමෙව්නා උයනේ රෝපණය කරවීම, ප්‍රථම භික්ෂුණී ආරාමය ඇතිවීම, බෝධීන් වහන්සේගේ ආරක්ෂාවට පැමිණි විවිධ කුල ශ්‍රේණි 18 නිසා ලංකාවේ විවිධ කර්මාන්ත බිහිවීම ආදිය සිදුවූයේ අද වැනි දිනකය.

මෙවැනි උතුම් පොහොය දිනයක මෙම දහම් පණිවුඩයෙන් අපේක්ෂා කරන්නේ සිතා මතා තිදොරින් කටයුතු කොට සහනය උදා කර ගැනීමේ වැඩපිළිවෙල ගැනය. බුදුරජාණන් වහන්සේ රජගහනුවර වේළුවනාරාමයෙහි වැඩ සිටින විට රාහුල පොඩිහාමුදුරුවන් වැඩ සිටියේ අම්බලට්ඨිකා නම් ස්ථානයේය. බුදුපියාණන් වහන්සේ රාහුල හිමියන් වැඩසිටි අම්බලට්ඨිකාවට වැඩම කළේ රාහුල හිමියන්ට අවවාද අනුශාසනා කිරීම සඳහායි. රාහුල පොඩි හාමුදුරුවන් බොරු කියනවාය කියා මේ සූත්‍රයෙහි සඳහන් නැත. නමුත් මේ සූත්‍රය දෙස බලන විට පෙනී යන්නේ ඉතා ළදරු වියෙහි ජීවත් වූ රාහුල පොඩි හාමුදුරුවන් බොරු කියන්නට ඇති බවයි.

කුඩා දරුවන්ට යමක් ඉගැන්වීමේදී උපමා භාවිතය සහ උපකරණ භාවිතය ඉතා සාර්ථක ක්‍රමයකි. බුදුන් වහන්සේ අම්බලට්ඨිකාවට වඩින විට රාහුල හිමියන් පා සේදීම සඳහා වතුර භාජනයක් තබා තිබුණි. තථාගතයන් වහන්සේ පා සෝදා ගෙන භාජනය තුළ වතුර ස්වල්පයක් ඉතිරි කළහ. රාහුල හිමියන් අමතා රාහුලයෙනි; මේ භාජනයේ වතුර තිබේදැයි ඇසීය. ස්වාමීනි, ටිකක් තිබේයැයි පිළිතුරු දුන්හ. එසේ නම් රාහුලයෙනි දැන දැන බොරු

කියන භික්ෂුවගේ මහණ කමද එසේම ටිකක් බව දේශනා කළහ. බුදුන් වහන්සේ එම දිය බඳුනේ තිබූ වතුර ස්වල්පය ඉවත් කර නැවත රාහුල හිමි අමතා රාහුලයෙනි; මේ ජල බඳුනේ වතුර තිබේදැයි විමසීය. ස්වාමීනි, මේ භාජනයෙහි වතුර නැත. හිස් භාජනයකි යනුවෙන් පිළිතුරු දුන්හ. එසේ නම් රාහුලයෙනි; දැන දැන බොරු කියනා භික්ෂුවගේ මහණ කමද එබඳු හිස් එකක් යයි පිළිතුරු දුන්හ. නැවත බුදුරජාණන් වහන්සේ එම භාජනය මුනින් නවා රාහුලය මේ භාජනයෙහි ජලය තිබේදැයි ප්‍රශ්න කළහ. රාහුල හිමියන්ගේ පිළිතුර වූයේ නැත යන්නයි. නැවත බුදුපියාණන් වහන්සේ එම භාජනය උඩුකුරු කොට රාහුලය, මෙම භාජනයෙහි ජලය ඇත්දැයි ප්‍රශ්න කළහ. එවි රාහුල හිමියන් කියා සිටියේ නැත ස්වාමිනි මෙම භාජනය හිස් එකක් කියාය. එහිදී බුදුන් වහන්සේ රාහුල හිමියන්ට දේශනා කළේ රාහුලය; දැන දැන බොරු කියනා භික්ෂුවගේ මහණ කමත් මෙබඳු හිස් එකක් බවයි. කුඩා දරුවෙකුගේ මනස හඳුනාගෙන උපකරණ භාවිතයෙන් සිදු කළේ බොරුකීමේ ආදීනව පෙන්වා දීමකි.

මේ සූත්‍රයෙහි තවත් උපමාවක් එයි. රජු කෙනෙකුට ඇතෙක් සිටී. මේ ජව සම්පන්න ඇතා යුද්ධයේදී කකුල් සතරින්, නගුටින් දළ දෙකින්, හිසෙන් යන සියලු අඟපසඟ වලින් යුද්ධ කටයුතු කරයි. නමුත් ඒ ඇතා තම සොඬවැල ප්‍රවේශම් කරගනී. සොඬවැල ප්‍රවේශම් කරගත යුතු නිසා මේ ඇතා ප්‍රවේශමෙන් යුද්ධ කරයි. රජතුමාට තවත් ඇතෙක් සිටී. ඌ සොඬවැල ගැනවත් හැඟීමක් නොමැතිව සොඬවැලෙන්ද යුද්ධ කරයි. එම ඇතා තම ජීවිතයම රජු වෙත පරිත්‍යාග කර ඇති බැවින් ඌට යුද්ධයේදී කළ නොහැකි පරිත්‍යාගයක් නැත. එසේම බොරුව නම්වූ අකුසලය කිරීමට හැකි පුද්ගලයාට තම ජීවිතයේ කළ නොහැකි අකුසලයක් නැත. ඒ නිසා රාහුලය බොරු කීම හොඳ නැත යනුවෙන් දෙවන උපමාවක්ද දක්වයි.

නැවතත් බුදුපියාණන් වහන්සේ තෙවනුව කණ්නාඩියේ උපමාව ඉදිරිපත් කරයි. රාහුලය කණ්නාඩිය තිබෙන්නේ කුමකටද? **"කිමත්ථියො ආදාසො?"** රාහුල හිමියන්ගේ පිළිතුර වූයේ පරීක්ෂා කොට බැලීමට යන්නය. **"පච්චවෙක්ඛනත්ථො භන්තෙ"** යනුවෙනි. රාහුල හිමියන්ගේ එම පිළිතුරට අනුව බුදුන් වහන්සේ දේශනා කළේ රාහුලය, පරීක්ෂා කොට කයින්, වචනයෙන් සිතින් කර්ම කරන්න කියායි.

කයින්, වචනයෙන්, සිතින් යම් කර්මයක් කිරීමේදී එය තමාට අනුන්ට, තමාට හා අනුන්ට යන දෙපිරිසටම අවැඩක් වේ නම් රාහුලය එය අකුසලයකි. එයින් දුක් විපාක ලැබෙන්නේය. තිදොරින් කර්ම කරන විට තමාට, අනුන්ට, දෙපිරිසටම වැඩක් වේ නම් රාහුලය එය කුසලයකි. එයින් සැප විපාක ලැබෙන්නේය. මෙසේ කල්පනාකොට පරීක්ෂාකාරීව කර්ම කළ යුතුයයි මේ සූත්‍රය උපදෙස් දෙයි. රාහුලයෙනි; තිදොරින් නරක කර්ම කිරීමට ලැජ්ජා වන්න. එවැනි කර්ම පිළිකුල් කරන්න. කුසල කර්ම කොට ඒ පිළිබඳව සිහිපත් කරමින් සතුටින් ජීවත් වන්න. අතීතයේ ජීවත් වූ මහණ බමුණන්ද තිදොර පිරිසිදු කරගෙන කුසල් කරමින් ජීවත් වූහ. අනාගතයෙහි ඇති වන මහණ බමුණන්ද එසේ කරන්නේය. වර්තමානයෙහි ජීවත් වන ඔබ වහන්සේලාද පරීක්ෂාකොට බලා කුසල කර්ම වඩා සැප විපාක ලබා ගන්නැයි උපදෙස් දෙයි. බුදුන්වහන්සේගේ මේ උතුම් දේශනාව තුන් කාලයටම ඉතා ගැලපෙන දේශණයකි. අවවාදයට ඉතා කැමති රාහුල පොඩි හාමුදුරුවන් මෙම දේශනාව අසා ඉතා සතුටට පත්වූ බව මෙම සූත්‍රය පැහැදිලි කරයි. අපේ සියලුම පොඩි ළමයි මේ කාරණය හොඳට හිතට ගන්න.

2013 වර්ෂය අවසන් වී 2014 වර්ෂය ආරම්භ වීමට ඇත්තේ තව දින කීපයකි. ඒ නිසා මෙම වර්ෂයේ අවසන් පෝය දිනය වන අද දිනයේ අපි සියලු දෙනාම ගතවූ වර්ෂය ගැන ආපසු හැරී බලමු. එම වර්ෂය තුල තිදොර මෙහෙයවා පරීක්ෂාකාරීව කටයුතු කලාද?

නැත්ද කියා පරීක්ෂා කර බලමු. එසේ බලන විට අපට සහනයක් දැනේනම් ඊට හේතුව සුපරීක්ෂාකාරීව වැඩ කටයුතු කර ඇති බවයි. අසහනයක් දැනේනම් ඊට හේතුව අපරීක්ෂාකාරීව වැඩකටයුතු කර ඇති බවයි.

තිදොර මෙහෙයවා කරන කටයුතු වල දී සමාජයේ කිසිවෙකුට නොදැනනසේ පුද්ගලිකව රහසිගතව, අප්‍රකටව ඒවා කළ හැකි බව අපි දනිමු. ඒවා කවුරු නොදැනගත්තත් තමාගේ සිත දන්නා බව අමතක නොකළ යුතුයි. ඇස ආදී ඉඳුරන්ගෙන් අපරීක්ෂාකාරීව කරන සියලු ක්‍රියා මනස දනී. එම මනස අපෙන් ප්‍රශ්න කරන විට අපට අසහනයක් දැනේ නම් එවිට හේතුව අප අපරීක්ෂාකාරීව කටයුතු කිරීමයි. මජ්ඣිම නිකායේ දේවදූත සූත්‍රයේදී ද කියන්නේ ජාති, ජරා, ව්‍යාධි, මරණ යන දේවදූතයින් හමුවෙහි අපි අපරීක්ෂාකාරීව කරන සියලුම ක්‍රියාවලට අප වගකිව යුතු බවයි. එම ක්‍රියා කළේ තමාගේ මව, පියා, සහෝදරයා, සහෝදරිය නොවේ. තමාමය. එසේනම් තමාම ඒවාට වගකිව යුතුයි. සමහර නිර්මාණවාදී ආගම් වල නම් පව් සමාකිරීමක් ඇත. බුදුදහම තුළ එවැනි ක්‍රියාදාමයක් නැති නිසා අප කරන සියලු ක්‍රියා වලට අප වගකිව යුතුයි. එසේ නම් කළ යුත්තේ කුමක්ද? කරන හැම ක්‍රියාවක්ම පරීක්ෂාකොට බලා කිරීමයි. රාහුල පොඩි හාමුදුරුවන්ට බුදුරජාණන් වහන්සේ ඉගැන්වූයේ එම සහනදායි වැඩපිළිවෙලයි. පසුගිය දිනවල රට පුරාම කඨින පිංකම් සිදුවිය. සමහරු හිතාගෙන ඉන්නේ කඨින පිංකමක් සිදුකළොත් තමා කළ සියලු පව් ඉවත් කර ගත හැකි බවයි. සමහර භික්ෂුන් වහන්සේලා එවැනි කඨිනානිශංස දේශනා කරනවා යයි දායකයෝ කියති. අප දන්නා තරමට නම් එවැනි කඨිනානිශංසයක් පොත පතක දැක නැත.අපරීක්ෂාකාරීව තිදොර මෙහෙයවා කටයුතු කරන අයට සිතට සහනයක් ගෙන දීමට එවැනි ආනිශංස ප්‍රකාශ කළත් එයින් සිදුවන්නේ අනුශාසකවරයාත්, දායකයාත් යන දෙදෙනාම අසහනයට පත්වීමයි. ඒ නිසා බණ කියන විටද ගිහි පැවිදි දෙපක්ෂයම පරීක්ෂාකාරී විය යුතුයි. අද ප්‍රකාශ කරන බොහෝ කඨිනානිශංස වල අපේක්ෂාව වී ඇත්තේ භව තණ්හාව වැඩි කිරීමයි. නමුත් කඨිනය වැනි උතුම් පිංකමකදී කළ යුත්තේ ලෝභ, දෝස, මෝහ නම් වූ කෙලෙස් කපා දැම්ම නම් වූ සල්ලේඛ ප්‍රතිපදාව පුහුණු කිරීමයි. එසේ කටයුතු කළොත් සහනය උදාකර ගත හැකිය.

2013 වර්ෂය තුළ අප තිදොරින් කළ ක්‍රියා දෙස නැවත හැරී බලා අඩුපාඩුකම් තිබේනම් ඒවා සකස් කරගෙන 2014 වර්ෂය සහනයෙන් ජීවත් වීමට කටයුතු කරමු. කයින් වැරදි 3ක් වචනයෙන් වැරදි 4ක් සහ සිතින් වැරදි 3ක් සිදුවන බව අපි දනිමු. ඒවා කරන්නේ අපරීක්ෂාකාරීව කටයුතු කරන අයයි. 2014 වර්ෂයේදී එම වැරදි 10 කපා දමා ක්‍රියා කොට ගිහි පැවිදි අප හැමදෙනාගේම දෙලොව සහනය උදාකර ගනිමු. එවිට කායික මානසික නිරෝගීතාවය උදාකරගත හැක. බොහෝ දෙනා අපරීක්ෂාකාරීව කටයුතු කොට අසහනය උදා වූ විට සහනය අපේක්ෂාවෙන් විවිධ ප්‍රාර්ථනා කරති. එවැනි ප්‍රාර්ථනා වලින් සහනය උදා නොවන බව මතක තබා ගත යුතුයි. යමෙක් එවැනි උත්සාහයක යෙදේ නම් එය වැලි මිරිකා තෙල් ගැනීමට ගන්නා උත්සාහයක් වැනිය.

පැරණි විහාරස්ථාන ඉතා සරළ වැඩ පිළිවෙලකින් යුක්තය. නමුත් අද විහාරස්ථාන සංකීර්ණ තත්වයට පත්වී තිබේ. බණ පොතේ කියන්නේ ගෙවල් ඇති තැනින් ගෙවල් නැති තැනට යාම පැවිද්ද බවයි. **"අගාරස්මා අනගාරියං පබ්බජි"** - නමුත් දැන් සිදුවී ඇත්තේ එක ගෙයක් තිබූ අපි එම ගෙය අතහැර දමා දැන් ඇවිත් තිබෙන්නේ ගෙවල් ගොඩක් ඇති පන්සලකටයි. ඒ නිසා භික්ෂුවකගේ සරළ ජීවිතය සංකීර්ණ බවට පත්වී තිබේ. මේ තත්වය යටතේ තිදොරින් කරන ක්‍රියා අපරීක්ෂාකාරී වීමට බොහෝ විට ඉඩ තිබේ. ඒ ගැන සැලකිලිමත් විය යුතුයි. සමහර පන්සල් වල ලොකු හාමුදුරුවන්ගේ එකම අපේක්ෂාව එක ශිෂ්‍යයෙකු ගැන පමණි. නිතරම කථා කරන්නේ එම ශිෂ්‍යයා ගැනය. අනෙක් ශිෂ්‍යයින් ගැන

හොඳක් කිසිවිටක ප්‍රකාශ නොකරයි. මේ තත්වය හැකි ඉක්මනින් වෙනස් විය යුතුයි. මෙවැනි දේ සිදුවන්නේ අපරීක්ෂාකාරීව වචන පාවිච්චි කිරීමෙනි. එවිට අනෙක් ශිෂ්‍යයින්ට තම පන්සල පිළිබඳ හැඟීමක් නැති වෙයි. පන්සලේ අනාගතය ගැන සිතා එවැනි ශිෂ්‍ය නමක් ඊට හුරු කිරීම වරදක් නැත. එහිදී සමබරතාවයෙන් යුක්තව පරීක්ෂාකාරීව කටයුතු කළ යුතුයි.

කාම භෝගී ජීවිත ගත කරන ගිහි පින්වතුන්ද ප්‍රවේශමෙන් තිදොරින් කර්ම කළ යුතුයි. අප නොදැනුවත්වම අපෙන් සිදුවන නරක කර්ම තමාට මෙන්ම සමාජයටත් අයහපත් ප්‍රතිඵල ගෙන දෙනු ඇත. කුඩා දරුවෙක් ඉපදුන විට එම දරුවා බැලීමට යාම හොඳසිරිතකි. මුල්ම දරුවා ගැහැණු දරුවෙකි. ඇයට තෑගි බෝග දී පසුව ඊළඟ දරුවා බැලීමට යයි. ඒ ගමනේදී ලොකු දුවට කිසිවක් රැගෙන නොයයි. පොඩි පුතුට තෑගි ගෙන ගොස් දී අවුරුදු 3 පමණ වයසැති දියණියට මෙසේ කියයි. "දැන් හරි වැඩේනේ. තෑගි ගෙනත් දෙන්නේ මල්ලිටනේ. ඔයාට මුකුත් නෑ. තාත්ත කීව කාර් එකත් මල්ලිට දෙනව කියලා. මේ ගෙදරත් මල්ලිටලු." නොසිතා නොමතා මෙසේ කියන විට එම දියණියන්ට සිතෙන්නේ අලුතෙන් ගෙදරට ආ මල්ලී මගේ හතුරෙක් ලෙසටයි. තෑගි සේරම මල්ලිට, කාර් එකත් මල්ලිටලු, ගේත් මල්ලිට දෙනවලු. මට මුකුත් නැත. කුඩා කල මැයටත් තෑගි ගෙනත් දුන්නට ඒවා ඇයට මතක නැත. ඒ නිසා කුඩා වයසේදීම මල්ලි කෙරෙහි ද්වේෂයක් ඇතිකර ගනී. මෙවැනි දේ සිදු වන්නේ වැඩිහිටියන් අපරීක්ෂාකාරීව වචන පාවිච්චි කිරීම නිසයි. බුදුරජාණන් වහන්සේ රාහුල හිමියන්ට දේශනා කළේ කල්පනාකොට තිදොරින් කර්ම කළ යුතු බවයි. වැඩිහිටියනි, අපිත් අද සිට එසේ කරමු.

දෙවු දියණියටත් සුළු තෑග්ගක් දී මෙහෙම කීවොත් කොතරම් හොඳද? "දුට දැන් මල්ලි කෙනෙකුත් ඉන්නවා. කොච්චර හොඳද? දුට දැන් මල්ලී සමග සෙල්ලම් කරන්න පුළුවන්. දෙන්නට එකට ඉස්කෝලේ යන්නත් පුළුවන්. මෙන්න දුටත් තෑග්ගක් ගෙනාව. මේ මල්ලිගෙ තෑගි ටිකත් දුම අරන් තියන්නකෝ." මෙහෙම වචන පාවිච්චි කළොත් එම දියණියට කොතරම් සතුටක් දැනේවිද? අපේ ගෙදරට ඇවිත් සිටින මගේ මල්ලී කොච්චර හොඳද? කව්රුත් කියනවනේ අපි දෙන්නට සෙල්ලම් කරන්නත් පුළුවන්ලු. ඉස්කොලේ යන්නත් පුළුවන්ලු. දැන් අක්කා මල්ලීට වෙනදාටත් වඩා ආදරයෙන් රැකබලා ගනීවි.

අද සිල් සමාදන් වී සිටින කුඩා දරුවන්, තරුණ තරුණියන්ද මේ ගැන සිතා මතා තිදොරින් කරන කටයුතු ගැන ඉතා සැලකිලිමත් විය යුතුයි. 2013 වසර ගැන සිතා තිදොරින් අපරීක්ෂාකාරීව සිදුකළ සියලු වැරදි ඉවත් කොට 2014 වර්ෂයේදී හිතා මතා තිදොරින් කටයුතු කොට සහනය උදාකර ගනිමු.

තෙරුවන් සරණයි... !